# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 99955
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


03/07/2011

## පුවත්පත් නිවේදනය

රාජ්‍ය සේවයේ ඉහල නිලධාරීන් සියලු දෙනාටම භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 446 මගින් 01.09.2010 සිට ක්‍රියාත්මක වන පරිදි දුරකථන දීමනා ලබා දෙන ලදී.

රාජ්‍ය අංශයේ ඉහල නිලධාරීන් කොටසක් වන වෛද්‍යවරුන්ගේ සේවාව අත්‍යවශ්‍ය සේවාවක් වන අතර මෙම දුරකථන දීමනාව අනිවාර්යයෙන්ම ලැබියයුතු නිලධාරීන් කොටස බව අමුතුවෙන් කිවයුතු නැත.

නමුත් ජූලි මස 3 වන ඉරිදා දිවයින පුවත්පතේ ප්‍රධාන පුවතට අනුව දුරකථන දීමනාව හිමි තවත් නිලධාරීන් රාශියක් සිටියදී, වෛද්‍යවරුන්ට එය ලබාදීම පලාත් සභාවලට මහත්වූ බරක් බව දන්වා ඇත.

අද සාමාන්‍ය වෛද්‍යවරයෙකුට ලැබෙන මූලික වැටුප රු. 26 000 වන අතර විශේෂඥ වෛද්‍යවරයෙකු සඳහා එය රු. 42 000 ක් පමණ වේ.කරුණු එසේ තිබියදී රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය නොවන සේවාවන්හි නිලධාරීන්ට පවා හිමිව ඇති දුරකථන දීමනාව වෛද්‍යවරුන්ට ලබාදීම අහෝසි කලහොත් එය සේවා බිඳ වැටීමකට හේතුවිය හැකි බව පෙන්වාදීමට කැමැත්තෙමු

වෛද්‍යවරුන්ට දුරකථන සේවා ලබා දීමට නොහැකි නම් එයට විකල්පයක් ලෙස හදිසි සේවා සඳහා වෛද්‍යවරු කැඳවීම පිණිස ඇමතුම් පොත් සමග ගිලන් රථ යෙදවිය යුතු බව අපි යෝජනා කර සිටිමු

මේ පිලිබඳව ජූලි මස 10 වන දින පැවැත්වීමට නියමිත වෛද්‍ය නිලධාරී සංගමයේ මධ්‍යම කාරක සභාවේදී වැඩිදුර සාකච්ඡාකර තීරණයක් ගැනීමට නියමිතව ඇත.

ලේකම්
රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

වැඩිදුර-වෛද්‍ය උපුල් ගුණසේකර- 0716841272